**බුද්ධිමය දේපළ අරමුදල - 2021**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**--------------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------------**

බුද්ධිමය දේපළ අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**------------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමග සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් වලින් දෙසැම්බර් 31 දිනට ඉතිරිවී තිබූ ලිපිද්‍රව්‍ය තොගවල වටිනාකම රු.2,853,549 ක් ලෙස අගය කර තිබුණද අවසාන තොගයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු නොකර මුළු ලිපිද්‍රව්‍ය වියදම මූල්‍ය කාර්සාධන ප්‍රකාශනයට ගලපා තිබුණි. | පිළිතුරු දී නැත | ඉතිරි ලිපිද්‍රව්‍ය තොග වටිනාකම අවසාන තොගයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගැලපිය යුතුය |
| (ආ) | කාර්යාල පරිගණක 75 ක් සඳහා රු.222,725 ක් ගෙවා මිලදීගත් ප්‍රතිවෛරස් මෘදුකාංගවල වලංගු කාලය 2021 ජුලි සිට 2022 ජුලි දක්වා විය. එබැවින් ඉදිරි වර්ෂය වෙනුවෙන් දරන ලද රු.118,982 ක් සඳහා ගැලපීම් කළයුතු වුවත් එසේ නොකිරීම නිසා, සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දී මෙම වරද නිවැරදි කිරීම සඳහා ගණකාධිකාරී වෙත උපදෙස් ලබාදුන් බව. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 68,822,101 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 67,051,672 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,770,429 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආයෝජන ආදායම් රු. 21,178,840 කින් අඩුවුවද, වෙළඳ ලකුණු ලියාපදිංචි කිරීමේ ආදායම රු. 14,449,231 කින් වැඩි වීම හා මුළු වියදම රු.8,721,584 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් භූමියක අයිතිය පවරා ගැනීමකින් තොරව බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානයක් ඉදිකරමින් පැවතියදී ඒ ආශ්‍රිත ඉඩම් සංවාරක කර්මාන්ත සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත්කරගෙන තිබුණි. ඒ අනුව ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් වැය කළ රු.22,298,751 ක මුදල එම අධිකාරිය වෙතින් අයකරගැනීම සඳහා 2015 මාර්තු 15 දිනැති අංක අමප/15/0272/623/007 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් එම භූමිය තක්සේරුකර ඉහත මුදල බුද්ධිමය දේපළ කාර්යාලය වෙත මුදාහැරීම සම්බන්ධයෙන් සමුපකාර තොග වෙළඳ සංස්ථාව එකඟතාව පළ නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදීද එම මුදල නිරවුල් කර ගැනීමට නොහැකිවී තිබුණි. | මේ සම්බන්ධයෙන් 2014 වර්ෂයේදී එම වැය වූ මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට කැබිනට් අනුමැතිය ලබා ගෙන ඇතත් මේ දක්වා එම මුදල් නාගරික සංවර්ධන අධිකාරිය මගින් ප්‍රතිපූර්ණය කර නොමැති අතර ඉදිරියේදී නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් ගොඩනැගිල්ලක් දිගු කාලීන බදු පදනම යටතේ ලබා ගැනීමට අදාළ ගිවිසුම සැකසීමට ආසන්න කාලය වන විට බුද්ධිමය දේපළ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීමට වැය වූ රුපියල් 22,298,751.27 ක මුදල ප්‍රතිපූරණය කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා තීරණය කර ඇති බව. | භූමියක අයිතිය පවරා ගැනීමකින් තොරව ගොඩනැගිලි ඉදි නොකළ යුතු අතර, 2015 මාර්තු 15 දිනැති අංක අමප/15/0272/623/007 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අනුමැතිය ලද ආකාරයට නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් එම මුදල බුද්ධිමය දේපළ කාර්යාලය වෙත ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේදී වැඩිපුර ගෙවා තිබූ රු.273,083 ක වැට් බදු මුදල් සමාලෝචිත වර්ෂයේදීද අය කර ගෙන නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේ දී අවශ්‍ය නිවැරදි කිරීම් සඳහා ගණකාධිකාරී වෙත උපදෙස් ලබාදුන් බව. | වැඩිපුර ගෙවූ මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද පේටන්ට් බලපත්‍ර සංඛ්‍යාව 181 ක් වූ අතර ඉන් බලපත්‍ර 30 ක් 2008 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ ලද ඉල්ලුම්පත් විය. පනතේ 83(1) වගන්තිය අනුව පේටන්ට් බලපත්‍රයක වලංගු කාලය ඉල්ලුම්පත් ලද දිනයේ සිට අවුරුදු 20 ක් වන බැවින් ඉල්ලුම්පත් ලියාපදිංචි කිරීම සඳහා වසර 06 ත් වසර 13 ත් අතර කාලයක් ගතව තිබීමෙන් වලංගු කාලයෙන් වැඩි කොටසක් ලියාපදිංචි ක්‍රියාවලිය සඳහා වැය වී ඇති බව නිරීක්ෂණය විය. මේ අනුව පේටන්ට් බලපත්‍රයක් ලබා ගැනීමෙන් ඉල්ලුම්කරු බලාපොරොත්තු වන සුරක්ෂිතභාවය ඉටු වී නොතිබුණි. | පේටන්ට් බලපත්‍රය වලංගු වනුයේ ඉල්ලුම් කළ දිනයේ සිට බැවින් ඉල්ලුම් කරුවන්ගේ අයිතිය අයදුම්පත යොමු කළ දිනයේ සිටම තහවුරු වන බව. | පේටන්ට් බලපත්‍රයක වලංගු කාලය ඉල්ලුම්පත් ලද දිනයේ සිට බලපැවැත්වෙන බැවින් ලියාපදිංචි ක්‍රියාවලියේ සිදුවන ප්‍රමාදයන් වළක්වාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි කරන ලද පේටන්ට් ගොනු 10 ක නියැදියක් පරීක්ෂා කිරීමේදී ද්විතීය පරීක්ෂාවේ දෝෂ නිවැරදි කිරීමට පනතේ 78(2) වගන්තිය අනුව, දැනුම් දුන් දින සිට මාස 03 ක් ඉක්මවීමට පෙර කළ යුතු වුවත් ඒ සඳහා මාස 10ක සිට මාස 41 ක් අතර පරාසයක කාලයක් ගතකර තිබීම පේටන්ට් ලියාපදිංචි කිරීම ප්‍රමාද වීමට හේතුවක් වී තිබුණි. | පේටන්ට් වාර්තා කෙටුම්පත් කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම නොමැති වීම, පේටන්ට් පරීක්ෂාවන් සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති වීම, සෑම තාක්ෂණික ක්ෂේත්‍රයකටම අදාළ තාක්ෂණික දැනුමෙන් යුතු නිලධාරීන් සංඛ්‍යාවක් නොමැති වීම බලපා ඇත. | ද්විතීයික පරීක්ෂාවන් සහ වෙනත් ආශ්‍රිත කාර්යයන් සිදුකිරීමේදී වන ප්‍රමාදයන් අවම කර ගත යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂවලට අදාළ නිම නොකළ ගොනු 600 ක් සමාලෝචිත වර්ෂයේ නිම කිරීමට සැලසුම් කර තිබුණද සැලසුම් කළ පරිදි එය ක්‍රියාත්මක වී නොතිබුණි. එම හේතුවෙන් පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රවලින් 2021 දෙසැම්බර් 31 දිනට නිම නොවූ පේටන්ට් ඉල්ලුම්පත්‍ර (ගොනු) සංඛ්‍යාව 1142 විය. | අතපසු වූ දේශීය ගොනු වලින් ගොනු 600 ක් COSTI ආයතනයේ නිලධාරීන් ලවා පරීක්ෂා කිරීමට සැලසුම් කළද එම ආයතනයේ ප්‍රතිචාර නොලැබීම මත එම ව්‍යාපෘතිය අසාර්ථක වූ බව. | වර්ෂය තුළ ලද ඉල්ලුම්පත්, සමාලෝචිත වර්ෂය තුළ දීම ලියාපදිංචි කිරීමට හැකි ලෙස අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පේටන්ට් සහ පේටන්ට් නොවන තාක්ෂණික දත්ත ගබඩා වෙත ප්‍රවේශවීමට පහසුකම් සැලසීමත්, ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කිරීමේදී වන දෝෂ හේතුවෙන් ප්‍රතික්ෂේපවන ඉල්ලුම්පත් ප්‍රමාණය අඩුකර ගැනීමත් මූලික අරමුණු කරගෙන ලෝක බුද්ධිමය දේපළ සංවිධානයේ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම තාක්ෂණ හා නවෝත්පාදන සහයෝගීතා මධ්‍යස්ථානයක් පිහිටුවීමට යෝජනා වී තිබුණි. ප්‍රතික්ෂේප වන ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව, ඉල්ලුම් කළ මුළු සංඛ්‍යාවෙන් සියයට 48 ක සිට සියයට 60 ක් අතර පරාසයක ඉහළ අගයක් ගැනීම අඩුකරගැනීමට, සමාලෝචිත වර්ෂයේදී මධ්‍යස්ථාන දෙකක් පිහිටුවීමට සැලසුම් කර තිබුණද ඉන් එක් මධ්‍යස්ථානයක් පමණක් පිහිටුවා තිබුණි. | Covid-19 වසංගත තත්වය සහ සංචරණ සීමා හේතුවෙන් 2021 වර්ෂය තුළ ආයතන වලට යෑමට අපහසු වුවද ආයතන 3ක් සමඟ සාකච්ඡා කර අවබෝධතා ගිවිසුම් සම්බන්ධ එකඟතාවන් වලට එළඹ ඇති අතර අදාළ ආයතන වෙතින් නිල එකඟතාවයන්ද ලැබී ඇති බව. | තාක්ෂණික හා නවෝත්පාදන මධ්‍යස්ථාන ජාලය පුළුල් කිරීම තුළින් නිර්මාණකරුවන්ට තාක්ෂණික තොරතුරු සඳහා ප්‍රවේශය හා ප්‍රතික්ෂේප වන ඉල්ලුම්පත් ප්‍රමාණය අඩුකර ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙල ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඉ) | මැඩ්රිඩ් ව්‍යාපෘතිය, හේග් ව්‍යාපෘතිය වැනි ජාත්‍යන්තර දත්ත සඳහා ප්‍රවේශවීමේ කාර්යයන් හා ප්‍රකාශන අයිතිය හා සම්බන්ධිත අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණය, වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පරිගණක තොරතුරු තාක්ෂණය සෘජුවම සම්බන්ධවන බැවින් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ පරිගණක මෘදුකාංග පද්ධතිය (IPAS) දියුණු කිරීම ප්‍රමාදවීම මෙම සියලුම ව්‍යාපෘතිවල කාර්ය සාධනය කෙරෙහි අහිතකර ලෙස බලපාන බව නිරීක්ෂණය විය. | ICTA ආයතනය සමඟ නැවත ගිවිසුමකට එළඹීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් නිරීක්ෂණ අනුව සකස් කරන ලද ගිවිසුමේ කෙටුම්පත නිරීක්ෂණ සඳහා 2022 පෙබරවාරි 17 වන දින ICTA ආයතනය වෙත යවන ලද අතර එම කෙටුම්පත සඳහා පළමු සිහිකැඳවීම් ලිපිය ද 2022 අප්‍රේල් 04 වන දින ICTA ආයතනය වෙත යවා ඇති අතර එහි ප්‍රධාන තාක්ෂණික නිලධාරි සහ නීති උපදේශක සමඟ දුරකථනයෙන් සාකච්ඡා කර ගිවිසුම් පිටපත්, මෙම කටයුත්ත කඩිනමින් ඉටුකර ගැනීම සඳහා ලබාදුන් බව. | පරිගණක මෘදුකාංග පද්ධතිය (IPAS) වැඩි දියුණු කර තාක්ෂණ පහසුකම් සැලසීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | කාර්මික සැලසුම් ජාත්‍යන්තරව ලියාපදිංචි කිරීම සඳහා පහසුකම් සපයන හේග් පද්ධතියට ප්‍රවේශවීම සම්බන්ධයෙන් මූලික අධ්‍යයනයක් 2020 වර්ෂයේදී සිදුකර වාර්තාවක් සකස් කර ඇතිමුත් අදාළ නීති තත්ත්ව, තාක්ෂණික කරුණුවල විෂය | පැවැති කොවිඩ් වසංගත තත්වය හමුවේ සැලසුම් කර තිබූ පරිදි වැඩමුළු පැවැත්වීමට නොහැකි වුවද මේ වන විටද හේග් පද්ධතියට ප්‍රවේශ වීමට අදාළ මූලික අධ්‍යයන කටයුතු සිදු කර ඇති අතර එම අධ්‍යයනයේ දී ලබා | ශක්‍යතා අධ්‍යයනය කඩිනම් කර ශ්‍රී ලංකාව හෙග් පද්ධතියට ප්‍රවේශවීම හෝ නොවීම සම්බන්ධයෙන් තීරණ ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක්ෂේත්‍රය පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කර අධ්‍යයන හා වැඩමුලු දෙකක් පැවැත්වීමට 2021 වර්ෂයේදී සැලසුම් කර ඇතත් එක් වැඩමුලුවක් පමණක් පවත්වා තිබුණි. එමෙන්ම සිදුකළ අධ්‍යයන වාර්තාව අනුව සුදුසුකම් ලත් කමිටු වලින් නිර්දේශ ලබා ගනිමින් කරනු ලබන ශක්‍යතා අධ්‍යයනයකින් අනතුරුව හෙග් පද්ධතියට ප්‍රවේශවීම හෝ නොවීම සම්බන්ධයෙන් තීරණය කළ යුතු බව එම වාර්තාවෙන් නිර්දේශ කර තිබුණි. එම නිසා සුදුසුකම් ලත් කමිටු වලින් නිර්දේශ ලබා ගනිමින් කරනු ලබන ශක්‍යතා අධ්‍යයනය ප්‍රමාදවීම මත හෙග් පද්ධතියට ප්‍රවේශවීම සම්බන්ධ තීරණයද ප්‍රමාදවන බව නිරීක්ෂණය විය. | ගත් නිරීක්ෂණ අනුව හේග් පද්ධතියට ප්‍රවේශ වීමට ප්‍රථම, නීතිමය රාමුව, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය, හේග් පද්ධතියට ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය ආයතනික පහසුකම් (උදා: IT) වැඩි දියුණු කිරීම හා විවිධ රටවල් වල අත්දැකීම් තවදුරටත් අධ්‍යයනය කිරීම වැනි කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා සුදුසුකම් ලත් කමිටු වලින් නිර්දේශ ලබා ගනිමින් සිදුකරනු ලබන ශක්‍යතා අධ්‍යයනයකින් අනතුරුව තීරණය කළ යුතු බව නිර්දේශ කරමින් අධ්‍යයන වාර්තාව ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව සිදුකරනු ලබන ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ නිර්දේශ අනුව ශ්‍රී ලංකාවේ හේග් පද්ධතිය වෙත ප්‍රවේශ විය යුතු බව තීරණය වුවහොත් ඒ සම්බන්ධ අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කෙරෙනු ඇති බව. | |
| (උ) | සංයුක්ත පරිපථ සඳහා වූ පිරිසැලසුම් නිර්මාණ ලියාපදිංචිය, භූගෝලීය දර්ශක ලියාපදිංචිය හා පරිපාලනය සඳහා පිළිවෙලින් පනතේ xxxi හා xxxiii පරිච්ඡේද වලින් විධිවිධාන සලසා ඇතිමුත් පනතට අවශ්‍ය සංශෝධන සිදුවී නොමැති නිසා සමාලෝචිත වර්ෂයේදීද එම ඉල්ලුම්පත් ලියාපදිංචි කිරීමේ කාර්යයන් ආරම්භ කර නොතිබුණි. විශේෂයෙන් භූගෝලීය දර්ශක ලියාපදිංචිය තුළින් ශ්‍රී ලංකාවට ආවේණික ද්‍රව්‍ය සඳහා සාර්ථක වෙළඳපොළක් ජාත්‍යන්තරව නිර්මාණය කිරීම අපේක්ෂා කර තිබුණි. | බුද්ධිමය දේපල පනතේ සහ රෙගුලාසිවල සංග්‍රහිත බුද්ධිමය පරිපථ සඳහා පිරිසැලසුම් නිර්මාණ ලියාපදිංචියට අදාළ නිරීක්ෂණ වාර්තාවන් පිළියෙල කරන ලද අතර නිරීක්ෂණ අනුව ලියාපදිංචි සඳහා පනතේ ඇති ප්‍රතිපාදන ඔස්සේ ලියාපදිංචි කිරීම සිදු කිරීමෙන් ගැටළුකාරී තත්ත්ව ඇති විය හැකි බවට නිරීක්ෂණය වන හෙයින් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම සඳහා අදාළ තොරතුරු බුද්ධිමය දේපළ උපදේශක කොමිසම වෙත ලබා දීමට තීරණය වී ඇති අතර ලියාපදිංචිය කිරීම සඳහා පනතට සංශෝධන ගෙන ඒම අවශ්‍ය බව. | සංයුක්ත පරිපථ සඳහා වූ පිරිසැලසුම් නිර්මාණ ලියාපදිංචිය, භූගෝලීය දර්ශක ලියාපදිංචිය හා පරිපාලනය සඳහා පනතේ විධිවිධාන සඳහා අවශ්‍ය සංශෝධන සිදුකළ යුතුය. |

**4.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**-------------------------------------------**

**4.1** **වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

**--------------------------------------------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| -------------------------- | ---------------------------------- | ------------- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ යේ 15.1 ඡේදයෙන් ඇතුළත් කර ඇති මුදල් රෙගුලාසි 877 හි (2)(ඉ) ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද 2021 දෙසැම්බර් 31 දින වන විට 2016 වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පමණක් පාර්ලිමේන්තු සභාගත කර තිබුණි. | කෙටි කාලයක් තුළ වරින් වර අවස්ථා පහකදී රේඛීය අමාත්‍යංශය වෙනස් වීම හේතුවෙන් 2015 සිට 2019 දක්වා කාලයට අදාළ වාර්ෂික වාර්තා සඳහා අනුමැතිය ලබා ගැනීමට බාධා සිදුවී ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |